**මහියංගණය ප්‍රාදේශීය සභාව**

**බදුල්ල දිස්ත්‍රික්කය**

---------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

----------------

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

---------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 23 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර,එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජූලි 24 වන දින සභාපතිවරයාට යවා ඇත.

1.2 **තත්ත්වාගණනය කළ මතය**

--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට මහියංගණය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

----------------------------------------

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

----------------------

(අ) ද්‍රව්‍ය ආධාර මිලදී ගැනීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු.2,328,470 ක් ණය හිමියන් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බතලයාය ජල ව්‍යාපෘතියට වැලි සැපයීම වෙනුවෙන් ගෙවිය යුතු රු.1,507,680 ක් සඳහා ණයහිමි ප්‍රතිපාදන රු.1,389,380 ක් වෙන් කර තිබීම හේතුවෙන් ණයහිමියෝ රු.118,300 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) 1988 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා මිලදී ගත් රු.582,864 ක වටිනාකමක් ඇති ඉන්වෙන්ට්‍රි භාණ්ඩ 149 ක් ප්‍රාග්ධනිත කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේශිය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කල රු.605,269 ක වැට් බදු වටිනාකම එම ගිණුම නිවැරදිව හර කර ඇතත් ,සමුච්චිත අරමුදල් ගිණුම සාවද්‍ය ලෙස බැර කිරීම හේතුවෙන් සමුච්චිත අරමුදල එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) පෙර වර්ෂවල සිට පැවත එන මෝටර් රථ හා කරත්ත ගිණුමේ තිබූ නොසැසඳුණු රු.50,804 ක ශේෂය සාවද්‍ය ලෙස ආදායමෙන් කපා හැර තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය තුලදී මිලදී ගත් රු.425,440 ක් වටිනා ස්ථාවර වත්කම්, ස්ථාවර වත්කම් ගිණුමට සහ ප්‍රාග්ධන යෙදවුමට ආදායමෙන් දායක වීමේ ගිණුමට ගිණුම්ගත නොවීමෙන් අදාල ගිණුම් එම වටිනාකමෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) ඉකුත් වර්ෂයේදී වසර 3 ක් සඳහා ඉදිරියට ලැබුණු පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ගාස්තු රු.31,748 ක් සමාලෝචිත වර්ෂයේ ලැබීම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

1.3.2 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

(අ) **ලැබිය යුතු ගිණුම්**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයකරගත යුතු රු.25,208,862 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂය තුළ වර්ෂ 26 ක් වූ හිඟහිටි වරිපනම් රු.2,177,423 ක්,වර්ෂ 3 ක් වූ හිඟහිටි ප්‍රාග්ධන ආධාර රු.14,861,318 ක්,වර්ෂ 17 ක් වූ හිඟහිටි වෙනත් ආදායම් රු.8,117,428 ක් ,වර්ෂ 6 ක් වූ අත්තිකාරම් රු.52,693 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) **ගෙවිය යුතු ගිණුම්**

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.31,424,626 ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂය තුළ වර්ෂ 3 ක් වූ විවිධ වියදම් ණයහිමියෝ රු.6,438,852 ක් හා කර්මාන්ත ණයහිමියෝ රු.24,985,774 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.3 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.8,764,548 ක් වූ ගිණුම් විෂයයන් 03 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.4 **අනුකූල නොවීම්**

1.3.4 1 **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | | **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවීම** |
|---|---|---|---|---|
| | | | රු. | |
| (අ) | i | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 49 වන වගන්තිය | | 2017 වර්ෂය තුල සභාව විසින් අනවසර ඉදිකිරීම් 05 ක් හඳුනාගෙන තිබුණද, මේ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. |
| | ii | 127 වන වගන්තිය | | සභා බලප්‍රදේශය තුල පවතින සුසාන භූමි 28 ක් සම්බන්ධයෙන් එම ඉඩම්වල ප්‍රමාණය හා අයිතිය සම්බන්ධව නිරවුල් විස්තර තහවුරු කරගෙන නොතිබුණි. |
| | iii | 128 වන වගන්තිය | | ප්‍රාදේශිය සභාවේ ඉඩම් හා ගොඩනැගිලි 18 ක හා සභාව පරිහරණය කරන අක්කර 22 රු.3 පර්චස් 37 ක පිහිටි දේපල වල අයිතිය පවරා ගෙන නොතිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| | iv | 158 හා 159 වන වගන්ති | 5,250,922 | හිඟ කඩ කුළී, වරිපනම් බදු හා ජල ගාස්තු අයකර ගෙන නොතිබුණි. |
| (ආ) | | 2006 අංක 12 දරන මුද්දර ගාස්තු විශේෂ විධිවිධාන පනත | 82,500 | 2015 වර්ෂයේ සිට 2017 දෙසැම්බර් 31 දින දක්වා මුද්දර බදු වටිනාකම වැටුපෙන් අයකර ගෙන දේශීය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ඇ) | | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ මුදල් රෙගුලාසි | | |
| | i | මුදල් රෙගුලාසි 104 (3), (4) | - | බැකෝ ලෝඩරයක් 2017 ඔක්තෝබර් 04 වන දින අනතුරකට ලක්වීම සම්බන්ධව ප්‍රාරම්භක වාර්තාවක් සහ පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. |
| | ii | මුදල් රෙගුලාසි 571 | 668,144 | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කල් ඉකුත්වූ තැන්පත් ශේෂ දෙකක් නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| | iii | මුදල් රෙගුලාසි 756 (1) | | 2015, 2016, 2017 වර්ෂ වලට අදාලව භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2018 මාර්තු 06 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.13,062,705 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.14,479,131 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

------------------------

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

-------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබු ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i)වරිපනම් හා බදු | 5,231,235 | 3,031,235 | 2,172,598 | 858,637 | 5,181,235 | 3,031,235 | 1,846,531 | 1,184,704 |
| (ii) කුලී | 14,235,562 | 2,228,450 | 1,922,950 | 305,500 | 12,024,582 | 2,336,200 | 1,944,600 | 391,600 |
| (iii)බලපත්‍ර ගාස්තු | 1,103,000 | 2,115,660 | 2,160,910 | 45,250 | 906,000 | 906,600 | 1,638,442 | - |
| (iv)වෙනත් ආදායම | 21,409,500 | 5,399,332 | 2,825,263 | 2,574,069 | 15,055,850 | 4,662,494 | 3,605,894 | 1,056,600 |
| එකතුව | 41,979,297 | 12,774,677 | 9,081,721 | 3,783,456 | 33,167,667 | 10,936,529 | 9,035,467 | 2,632,904 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

2017 දෙසැම්බර් 31 දිනට මුළු බිල් කළ ආදායම රුපියල් මිලියන 12.8 ක් වූ අතර,වර්ෂය තුළදී රැස්කළ ආදායම රුපියල් මිලියන 9 ක් විය. කෙසේ නමුත්,වර්ෂය අවසාන වනවිටත් රුපියල් මිලියන 3.8 ක ආදායමක් රැස්කර ගැනීමට තිබුණු අතර,පෙර වර්ෂය සමඟ සැසඳීමේදී හිඟ ආදායම් අයකර ගැනීම් සියයට 44 කින් අඩු වී තිබුණි.

### 2.2.3 වරිපනම් හා බදු

2017 දෙසැම්බර් 31 දිනට වරිපනම් බදු ලේඛනය අනුව හිඟහිටි වරිපනම් බදු ආදායම රු.1,962,789 ක්වූ අතර මෙම හිඟ ශේෂය තුල වරිපනම් ඒකක 21 කින් අයවිය යුතු වසර 2 ක් ඉක්මවූ රු.5,000 ට වැඩි හිඟ රු.594,041 ක් පැවතුණි.

### 2.2.4 බදුකුලී

1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව අවුරුදු පහෙන් පහට බදු කුලී තක්සේරු කළ යුතු වුවත්, කඩ කාමර 13 ක් සඳහා 2011 වර්ෂයේ තක්සේරුව පදනම් කරගෙන රු.2,000 හා රු.1,700 ක් ලෙස කුලී අයකරගෙන තිබුණි. 2017 ජනවාරි 23 දින නව තක්සේරු වාර්තා සභාව වෙත ලැබී ඇතත්, එය ක්‍රියාත්මක නොකිරීම නිසා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු.567,000 ක පාඩුවක් සිදුව තිබුණි.

### 2.2.5 බලපත්‍ර ගාස්තු

(අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය අනුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන ව්‍යාපාර සඳහා බලපත්‍ර ලබාගත යුතු වුවත්,පෞද්ගලික වෙළඳ සංකීර්ණයෙහි පවත්වාගෙන යන ව්‍යාපාර 17 ක් වෙළෙඳ බලපත්‍ර ලබාගෙන නොතිබුණි.

(ආ) 1980 අංක 47 සහ 1988 අංක 56 දරන ජාතික පාරිසරික පනතේ විධිවිධාන ප්‍රකාරව 2000 අංක 53 දරන පනතින් සංශෝධිත 2008 ජනවාරි 23 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍ර අංක 1533/16 ප්‍රකාරව පරිසර බලපත්‍ර ලබාගත යුතු වුවත්, ව්‍යාපාර 9 කින් ප්‍රවර්ථන වර්ෂය සඳහා පාරිසරික බලපත්‍ර ලබාගෙන නොතිබූ අතර, එමගින් සභාවට රු.80,010 ක ආදායමක් අහිමිවී තිබුණි.

2.2.6 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු.2,941,265 ක් සහ මුද්දර ගාස්තු රු.1,500,000 ක් විය.

3. **මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

3.1 **කාර්යසාධනය**

-------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම,ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වු කරුණු පහත දැක්වේ.

(අ) **අතුරු ව්‍යවස්ථා**

------------------

ප්‍රාදේශිය සභා බලප්‍රදේශය තුල ගාල්කරන එක් ත්‍රිරෝද රථයකින් මාසයකට රු.100 ක ගාස්තුවක් අයකර ලියාපදිංචි කර තිබුණු නමුත් එම ගාස්තු අයකර ගැනීම සඳහා අතුරු ව්‍යවස්ථාවක් පනවා ගෙන නොතිබුණි.

(ආ) **ක්‍රියාකාරි සැලැස්ම**

--------------------

2017 වර්ෂයට ක්‍රියාකාරි සැලැස්මක් සකස් කර නොතිබුණි.

(ඇ) **ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

---------------------------------

2013 වර්ෂයේ දී පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ ජාතික ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘතියේ විවිධ කාර්යයන් සඳහා රු.13,665,854 ක් වියදම් දරා තිබුණු අතර, 2018 මාර්තු 06 දිනය දක්වාම ව්‍යාපෘතියේ අරමුණුගත කාර්යයන් සඳහා ඝණඅපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රියාවලියක් ආරම්භකර නොතිබුණි.

(ඈ) **තිරසර සංවර්ධන ඉලක්ක**

------------------------------

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් සහා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගු කාලීන සැලසුම් 2017 දෙසැම්බර් 31 දින තෙක් සකස් කර නොතිබුණි.

(ඉ) **අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම**

-----------------------------------------

(i) 2014 වර්ෂයේදී පළාත් පාලන අමාත්‍යාංශයේ පසුගාමි පළාත් පාලන ආයතන නඟා සිටුවීමේ වැඩසටහන යටතේ මහියංගණය ප්‍රාදේශීය සභාවට අයිති නව සතිපොළ සහ ගොඩනැඟිලි ඉදිකිරීම සඳහා රු.4,106,149 ක් වැයකර තිබුණද, එම භූමිය ප්‍රමාණවත් නොමැති වීම හා වගුරු බිමක් වීම හේතුවෙන් ප්‍රයෝජනයට ගත නොහැකිව තිබුණි. එම සතිපොළ ප්‍රයෝජනයට ගත හැකි තත්ත්වයට පත් නොකර, පෞද්ගලික ඉඩමක සතිපොළ පවත්වාගෙන යාම වෙනුවෙන් වර්ෂයකට රු.120,000 ක් ගෙවා තිබුණි.

(ii) දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් ලබාගත් රුපියල් මිලියන 10 ක ණය මුදලක් සහ ප්‍රාදේශීය සභා අරමුදලින් රුපියල් මිලියන 6. 5ක් යොදවා රු.4,991,720 ක

වටිනාකමකට 2015 ඉදිකිරීම ආරම්භ කර තිබූ ආදාහනාගාරය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වැඩ අවසන් කර නොතිබීම හේතුවෙන් ප්‍රදේශයේ ජනතාවට මෙහි සේවය අහිමිවී ගොස් තිබුණි.

3.2 **මානව සම්පත් කළමනාකරණය**

------------------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩලයේ සේවක පුරප්පාඩු 06 ක් හා අතිරික්ත 38ක් පැවතුණි.

3.3 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

--------------------------------

2017 වර්ෂයට සොරබොර වැව අසල වාහන නවතා තැබීමේ ස්ථානය බදු දීම වෙනුවෙන් 2016 නොවැම්බර් 17 දින ඇතිකරගත් ගිවිසුමේ 5 වන කොන්දේසිය ප්‍රකාරව එක් එක් මාසයේ බදු මුදල් එම මාසයේ 31 දිනට හෝ ඊට පෙර අයවිය යුතු අතර, ප්‍රමාදවන සෑම මාසයක් සඳහාම සියයට 10 ක ගාස්තුවක් දඩ මුදල් ලෙස අයකර ගතයුතු විය. එහෙත් බදු මුදල් ගෙවීම පැහැර හැරීම හේතුවෙන් 2017 දෙසැම්බර් 31 දිනය වන විට රු.407,993 ක බදු මුදලක් හා දඩ මුදලක් අයවිය යුතුව තිබුණි.

3.4 **වත්කම් කළමනාකරණය**

-----------------------------

3.4.1 **නිෂ්ක්‍රීය වත්කම්**

------------------

ප්‍රාදේශීය සභාව සතු පිරිවැය එකතුව රු.2,147,854 ක් වූ ත්‍රීවිල් රථයක් හා ට්‍රැක්ටර් රථ දෙකක් වසර 3 ක සිට 5 දක්වා කාලයක් නිෂ්ක්‍රියව තිබුණු නමුත් අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

3.5 **ප්‍රසම්පාදනය**

-------------------

3.5.1 **ප්‍රසම්පාදන සැලැස්ම**

----------------------

සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රාදේශිය සභාව විසින් ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර නොතිබුණි.

4. **ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

----------------------------------------

4.1 **අයවැය පාලනය**

------------------

සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ආදායම් හා වියදම් සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

5. **පද්ධති හා පාලන**

-------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| | ---------- | | ----------- |
| (අ) | ගබඩා පාලනය | (i) | ගබඩා ලේඛනය විධිමත්ව නඩත්තු කර නොතිබීම. |
| (ආ) | ආදායම් පරිපාලනය | (i) | ආදායම් ලේඛන නඩත්තු කර නොතිබීම. |
| | | (ii) | හිඟ ආදායම් අයකර නොගැනීම. |
| | | (iii) | ප්‍රචාරක දැන්වීම් පිළිබඳව තොරතුරු ඇතුළත් ලේඛනයක් නඩත්තු කර නොතිබීම. |
| | | (iv) | ප්‍රදේශයේ දැන්වීම් පුවරු පිළිබඳ වාර්ෂික සමීක්ෂණයක් කර නොතිබීම. |